මනෝ විද්‍යාව

# මිනීමැරුම් සහ මානසික සෞඛ්‍යය

මනෝවෛද්‍ය විශේෂඥ
**වෛද්‍ය සරත් පඬුවාවල**

**මිනීමැරුමකට තම පවුලේ අයෙක් ගොදුරු වූ බොහෝ අවස්ථාවන්හිදී වරදකරු අසාමාන්‍ය මානසික තත්ත්වයක සිටී. ආගන්තුක මරණයකදී බොහෝ වරදකරුවන් මානසික වශයෙන් සාමාන්‍ය පුද්ගලයින් ය.**

ශ්‍රී ලංකාවේ සතර දිග්භාගයෙන් අසන්නට ලැබෙන අපරාධ අතර මිනීමැරුම් මුල්තැනක් ගනී. වර්තමානයේ මෙරට සිදුවන මිනීමැරුම් සංඛ්‍යාව ඉහළ ගොස් ඇති අතර මෙය ඇත්තෙන් ම මානසික සෞඛ්‍ය පිරිහීමේ දර්ශකයක් ලෙස සැලකිය හැකි ය. මිනීමැරුම් පහත දක්වෙන අයුරින් වර්ග කළ හැකි ය.

(1) මිනීමරුවා හා ගොදුරු වූ තැනැත්තා අතර ඇති සම්බන්ධතාව .
(2) මිනීමැරුම සිදුවන අවස්ථාව
(3) මිනීමැරීමේ ක්‍රමය
(4) මිනීමරුවා කුමන අන්දමේ පුද්ගලයෙක් ද යන්න
(5) මිනීමැරීමට පෙළඹුනු හේතුව

මිනීමැරුම් ගැන සැලකුවහොත් මිනීමරුවා හා ඊට ගොදුරු වූ තැනැත්තා අතර කලක පටන් පවත්නා යම් සම්බන්ධතාවයක් දක්නට ලැබේ. බොහෝවිට එකම පවුලේ අය නෑදෑයින්, අඹුසැමියන් හෝ පෙම්වතුන් මීට සම්බන්ධ ය. සමහර විට යහළුවන් හෝ දන්නා හඳුනන අයයි. සමහර මිනීමැරුම්වලට ගොදුරුවූ තැනැත්තා ආගන්තුකයෙකි. මිනීමැරුමකට තම පවුලේ අයෙක් ගොදුරු වූ බොහෝ අවස්ථාවන්හිදී වරදකරු අසාමාන්‍ය මානසික තත්ත්වයක සිටී. ආගන්තුක මරණයකදී බොහෝ වරදකරුවන් මානසික වශයෙන් සාමාන්‍ය පුද්ගලයින් ය. කාන්තාවන් මිනීමැරුම් සිදු කිරීමේදී තමන් ද දිවිනසා ගැනීමට උත්සාහ කරන අතර නිතර ම ඊට ගොදුරුවන්නේ පවුලේ උදවිය යි.

මිනීමරුවන්ගේ මානසික තත්ත්වය පරීක්ෂාකරන විට අන්තර් පුද්ගල ආරවුල්, ඊර්ෂ්‍යාව, ශෝකයෙන් රෝගීවීම, උමතු බව, වෙනයම් ආබාධිත තත්ත්ව හා මත්පැන් භාවිතය යන කරුණු සැලකිල්ලට ගත යුතු ය. බිරිඳ හා දූ දරුවන් සමග මුළු පවුලම ඝාතනය කිරීමකින් පසු තදබල ලෙස ශෝකයෙන් රෝගී වූ සැමියෙක් දිවිනසා ගැනීම සිදුවිය හැකි ය. බොහෝවිට එවන් දිවිනසා ගැනීම් සාර්ථක වන අතර යම් යම් කරුණු නිසා පවුලේ අන් අය මිය ගොස් තමන්ගේ නැත වරදින අවස්ථා ඇත. එවැනි අය තීව්‍ර ලෙස උමතු වූ බවක් සොයා ගත හැකිය. සමහර විට ඔවුන් අස්වාභාවික නිසල බවකින් ද යුක්ත විය හැකිය. එවැනි තැනැත්තන් තදබල ලෙස දිවි හානි කර ගැනීමේ චේතනාවෙන් සිටියා විය හැක. අත් අඩංගුවේ සිටියදී පවා දිවිනසා ගැනීමට උත්සාහ කිරීමට හැකි අතර සමහරවිට එය සාර්ථක කර ගනිති. මෙවන් බොහෝ අවස්ථාවලදී මොවුන් සැඟවීමට උත්සාහ නොකරන අතර සමහර විට පොලිසියට ගොස් භාරවෙති. ප්‍රශ්න කිරීමකදී ඔවුන් කළ කී සැම දේ විස්තරාත්මකව පවසනු ඇත. කෙසේ වුවද තමන්ගේ ඥාතියෙක් ඝාතනය කළ තැනැත්තෙක් එය සිදුවන අවස්ථාවේ ශෝකයෙන් රෝගීව නොසිටියත්, තමා කළ දේ ගැන පසුතැවිලි විය හැකි බැවින් දුක්බර වූ ස්වභාවයක සිටීමට පුළුවන. පරීක්ෂණයකදී එවැන්නක් වෙන් කර ගැනීම වැදගත් ය.

### කාලත්‍රයා (සැමියා හෝ බිරිඳ) ඝාතනය කිරීම

මිනීමැරුම්වලින් 50% පමණ සිදුවන්නේ රණ්ඩුසරුවල් වීමේ ප්‍රතිඵලයක් ලෙස හා හදිසි කෝපය නිසා ය. බිරිඳ හෝ සැමියා අතින් මිනීමැරුම් සිදුවන්නේ මෙලෙස බවට සැකයක් නැත. ඇත්තෙන් ම බොහෝ අඬදබර සහිත විවාහ ජීවිත මරණවලින් කෙළවර නොවුවත් ආවේගශීලි ලෙස ක්ෂණිකව තදින් හැඟීම් පිටකිරීම් සහිතව සිදුකරන මිනීමරුම් වලදී, මානසික රෝගී තත්ත්ව ලිංගික වශයෙන් වූ ඉච්ඡාභංගත්වයන්, මූල්‍යමය හෝ පරිසරයේ වූ යම් යම් බිඳවැටීම්, නිදන්ගත වෛවාහික ගැටළු ආදියෙන් පිරි පසුබිමක් දක්නට ලැබේ. වයස අවුරුදු 16 ට ඉහළ ගැහැනු මිනීමැරුම් වලදී 40% පමණ වරදකරු සැමියා වූ අතර 25% පමණ අවස්ථාවලදී වරදකරු පෙම්වතා වූ බව එක්තරා අධ්‍යයනකදී (ලංකාවේ නොවේ) පෙනී ගොස් තිබේ.

කාලත්‍රයා ඝාතනයට හේතුවන ප්‍රබල සාධකයක් වන්නේ ව්‍යාධිමය ඊර්ෂ්‍යාව යි. මෙය බොහෝ විට වයස අවු. 40 දශකයේ දී දක්නට ලැබෙන අතර මෙහිදී පසුගිය කාලයේ ඒ හා බැඳි මානසික රෝග ඉතිහාසයක් නොමැත. මෙවැනි තත්ත්වයකදී තම කලත්‍රයා වෙනත් අය සමග සබඳකම් (විශේෂයෙන් ලිංගික) පවත්වන බවට වූ අස්වාභාවික විශ්වාසයක් ගොඩ නැගේ. මෙහිදී යම් යම් සිද්ධීන් පිළිබඳ වැරදි වැටහීම් ඇති වී ඒවා සාධාරණ හේතු ලෙස සැලකේ. ඒ පිළිබඳ කරුණු දැක්වීමකින් පසු තාවකාලික පිළි ගැනීමක් සිදුවිය හැකි වුවද, කලත්‍රයාගේ හැසිරීම් පිළිබඳ සැකෙන් හා ඉතා පරීක්ෂාවෙන් සිටී. ස්විස්තරාත්මක ප්‍රශ්න කිරීම්වලින් පසු ඇතිවන අඬදබර හා පහරදීම් ද අනෙකුත් ප්‍රචණ්ඩකාරී ක්‍රියා ගැන තර්ජන ආදිය ද කෙරේ. මානසික රෝග අතර අනතුරුදායක බවින් ඉතාමත් වැඩි තත්ත්වය ව්‍යාධිමය ඊර්ෂ්‍යාව යි. මෙවැන්නන් අතර භින්නෝන්මාදයෙන් හෝ විසාදයෙන් පෙළෙන අයද විශ්වාස පිළිබඳ ආබාධවලින් හා චෙන්ද්‍රිය මානසික ආබාධවලින් පෙළෙන්නන් ද, මත්පැනට ඇබ්බැහි වූවන් ද වෙති. සැමියා විසින් බිරිඳගේ පෙම්වතායයි විශ්වාස කරන තැනැත්තාට ද අනතුරක් කිරීමේ ඉඩක් තිබේ. කලත්‍රයා ඝාතනය කිරීම භ්‍රාන්තිමය ලක්ෂණ සහිත ශෝක උමතුවේ ප්‍රතිඵලයක් ලෙස සිදුවිය හැකි අතර මෙවන් තත්ත්වයකදී ඝාතකයා ද දිවිනසා ගැනීමට පුළුවන. සමහර විට පීඩනොන්මාද ලක්ෂණ සහිතව භින්නොන්මාදයෙන් පෙළෙන්නන් ද ඝාතකයින් වීමට පුළුවන. මත්පැන් භාවිතය සමග හටගන්නා කෝපය හා ප්‍රචණ්ඩත්වය නිසා බිරිඳට පහරදීම සමහරවිට ඇගේ මරණයෙන් කෙළවර විය හැකි ය.

සැමියා හෝ බිරිඳ හෝ වෙනත් ඥාතියෙක් ඝාතනය කිරීම එම අය යම් රෝගයක හෝ ආබාධිත බවකින් දුක් විඳිනවා බලා සිටීමට

නොහැකි යම් අනුකම්පා සහිත පෙළඹවීමක් නිසා විය හැක. බිරිඳක් විසින් සැමියා ඝාතනය, සැමියෙක් විසින් බිරිඳක් ඝාතනය කරනු ලබනවාට වඩා අඩුවෙන් සිදුවන්නකි. බොහෝවිට ඊට හේතුවන්නේ කාලාන්තරයක් තිස්සේ සැමියාගේ වධහිංසා ඉවසාගත නොහැකි වූ විට ය. බීමට ඇබ්බැහි වූ සැමියෙක් බිරිඳක් විසින් සමහරවිට දූපුතුන්ගේ ද සහාය ඇතිව ඝාතනය කරනු ලැබීම් මෙරටින් වාර්තා වූ අවස්ථා රැසකි.

### දෙමාපිය ඝාතනය

මව හෝ පියා ඝාතනය කිරීම් පිළිබඳ මෑත අතීතයේ මෙරටින් වාර්තා වූ අවස්ථා රැසකි. මේවා බොහොමයක් ඉඩකඩම් පිළිබඳ ප්‍රශ්න වූ අතර සමහර ඝාතකයින් බීමට ඇබ්බැහි වූවන් විය. කෙසේ වුවද පුතෙක් විසින් මව ඝාතනය වීම කලාතුරකින් සිදුවන්නකි. මෙහිදී ඝාතක පුතා තරුණවියේ පසුවන්නෙක් වන අතර මව ඔහුගේ කටයුතු ගැන නිරන්තර ඇඟිලි ගැසීමක් (කෑව ද බිව්ව ද යනුවෙන් නිතර සොයමින් ඔහු පසුපස නිතර සිටීම) කුඩා කල සිට ම දක්නට ලැබෙන අතර පුත්‍රයා තම කටයුතු පිළිබඳ එතරම් තැකීමක් නොකරන අයෙකි. තදබල ප්‍රචණ්ඩකාරී ලෙස අපරාධය සිදුවන අතර ඒ ගැන අමතක කරන ඝාතකයා ඉන් සැහැල්ලුවක් ලබා ගනී. තමා විසින් සිද්ධිය සවයං සාධාරණීකරණය කර ගනී. බොහෝවිට මෙවැනි අය භින්නොන්මාදයෙන් පෙළෙන්නන් ය. මව ඝාතනය කිරීම බොහෝවිට සිදුවන්නේ මෙවැනි ආබාධවලින් පෙළෙන්නන් විසිනි. භින්නොන්මාදයෙන් පෙළෙන්නන් කලාතුරකින් ප්‍රචණ්ඩකාරී වන අතර මිනීමැරුමට බොහෝවිට ඉලක්ක වනුයේ තම මව යි.

පිතෘ ඝාතන මව්පිය ඝාතන අතර සුලබ තත්ත්වය වන අතර මෙහි දී ඝාතකයා මවට වඩා කිට්ටු බවක් පෙන්වයි.

පියා තදබල කෲර ගතිගුණ ඇති මත්පැන් භාවිතා කරමින් තම පවුලට කරදර කරයි. තදබල එදිරිවාදි බවක් පෙන්වයි. මරණ සිදු වන්නේ මත්පැන් බී වෙරි වී කලහකාරීව හැසිරෙන අතර ය.

> මිනීමැරුම් වලින් සෑහෙන ප්‍රමාණයක් ආසාමන්‍ය මානසික තත්ත්වයක් ඇති ඝාතකයින් මගින් සිදු වේ. තදබල ලෙස ශෝකයෙන් රෝගී වීම මින් ප්‍රධාන හේතුවකි. භින්නොන්මාදයෙන් පෙලෙන්නන් කලාතුරකින් මිනීමරුවන් බවට පත් වේ. මේවාට බොහෝවිට අසාමාන්‍ය සංවේදන (විශේෂයෙන් ශ්‍රවණ භ්‍රාන්තිමය තත්ත්ව) හේතු වේ. සමහර අපස්මාර තත්ත්ව වලින් පෙලෙන්නන් ද යම් යම් අවස්ථාවලදී මිනීමරුම් සිදු කිරීමට පුළුවන.

### දරුවන් ඝාතනය කිරීම

මීත් වැදගත් තැනක් ගන්නේ අලුත උපන් බිලිඳුන් ඝාතනය යි. මෙය බොහෝවිට සිදුවන්නේ බලාපොරොත්තු නොවූ හෝ නොවූමනා ලෙස තැනහොත් අවජාතක ලෙස හට ගත් බිළිඳුන් සම්බන්ධව ය. මව සාමාන්‍යයෙන් තරුණ කාන්තාවක් වන අතර සමහර විට උමතු බවින් තැත්තම් ශෝකී බවින් රෝගී වී දිවිනසා ගැනීමේ චේතනාවෙන් සිටින්නියක් විය හැක. මෙවැනි අය සැමවිටක ම වාගේ ගැබිණි බවක් නොතිබුණ බව කියන අතර මවක් වීම සඳහා මානසිකව සූදනම් වීමක් නැත.

අවුරුදු 16 න් පහළ ළමුන් ඝාතනය වීම බොහෝවිට මානසිකව රෝගී වූ දෙමව්පියන් අතින් සිදු වේ. තදබල ලෙස ශෝකයෙන් රෝගී වූ මවක් තම දරුවන් සියලු දෙනා ඝාතනය කර තමා ද දිවිනසා ගැනීමේ අවස්ථා නිතර දක්නට ලැබේ. මව රටගිය පසු තම දරුවන් දිගේ ගිල්ලා මරා තමන් ද දිවිනසා ගත් පියවරුන් පිළිබඳව පසුගිය කාලයේ අසන්නට ලැබිණි. දෙමව්පියන් ගේ පහරදීම්වලින් මියැදෙන දරුවන් සාමාන්‍යයෙන් අවුරුදු 5 ට අඩු ය. මෙවැනි මරණ සිදුවනුයේ තදබල ලෙස කෝප වූ අවස්ථාවලදී ය.

වයස අවුරුද්දකට අඩුකාලයේ දී සිදුවන ළදරු ඝාතන බොහෝ විට පසු ප්‍රසව අවදියේ මවගේ මානසික රෝගි තත්ත්ව හා සම්බන්ධ විය හැකි ය. පියවරුන් විසින් කරනු ලබන ළදරු ඝාතන බොහෝවිට ප්‍රචණ්ඩකාරී හා සමාජ විරෝධී පෞරුෂයකින් හෙබියවුන් විසින් කරනු ලබන ඒවා ය. මෑත කාලයේ පොළොවේ ගසා ළදරුවන් මරා දැමීම පිළිබඳව ප්‍රවෘත්ති අසන්නට ලැබිණ. ඝාතකයින් ඉහත කී ආකාරයේ පෞරුෂ ලක්ෂණ ඇතියවුන් විමට පුළුවන. බිලි පූජා පවත්වා නිදන් හැරීමේ පරමාර්ථයෙන් දරුවන් (තුන් කුළුඳුල් බිල්ල) ඝාතනයට ලක් කෙරුනු අවස්ථා මෑත කාලයේ මෙරටින් අසන්නට ලැබිණ.

### ලිංගික අපරාධ සමග සිදුවන ඝාතන

පවුල් පරිසරයට පිටත දී සිදුවන ස්ත්‍රී ඝාතනවල දී ලිංගික සාධක ද අන්තර්ජගතය . ඝාතකයා ගොදුරු කර ගන්නා කාන්තාව ආගන්තුක හෝ තමන් දන්නා හඳුනන අයෙක් විය හැකි ය.

ලිංගික අපරාධය කරන සමහර අවස්ථාවලදී ඇතිවන කලබලකාරී තත්ත්වය නිසා මරණය සිදුකළ හැකිය. සමහර අවස්ථාවලදී ඝාතකයාගේ පරපීඩක කාමුකත්වය(SADISTIC)ඉස්මතු වේ. මෙහිදී ඝාතකයා ලිංගික උත්තේජනයත් සමග කාන්තාව කපා කොටා කුරිරු ලෙස ඝාතනය කරයි. සමහරවිට පහරදීමෙන් පසු ලිංගිකව සම්බන්ධවීමට උත්සාහ කෙරේ. ඝාතකයින් බොහෝවිට සමාජ විරෝධී පෞරුෂයෙන් යුක්ත වන අතර ඔවුහු ඝාතනයේ වගකීම භාර ගන්නේ නැත.

### ආගන්තුක පුද්ගල ඝාතනය

පසුගිය කාලය තුළ මෙරට දනහැඳුනුම් නොමැති පුද්ගල ඝාතනය ඉතා ඉහළ ගොස් තිබේ. රථවාහන ඇතුළු දේපොළ පැහැර ගැනීමේ අටියෙන් හෝ කොන්ත්‍රාත් පදනම මෙන් ඝාතනය කිරීම් ඉතා විශාල වශයෙන් මෙරට සිදු වේ. මෙවැනි මිනීමැරුම්වලදී ඝාතකයන්ගේ මානසික තත්ත්වයේ අසාමාන්‍ය බවක් නොපෙනේ.

### මිනීමැරුම්වලට භාවිත කරන ක්‍රම

බොහෝ විට පිහියා කිනිසි වැනි තියුණු ආයුධ භාවිත කෙරේ. මීට අමතරව පහරදීම්, පයින් ගැසීම් ආදිය නිසා ද ඝාතන සිදු වේ. තවද ගෙල සිරකිරීම මොට ආයුධවලින් පහරදීම ආදිය ද සුලබ ය. වෙඩි තැබීම් හා බෝම්බ ගසා මරණයට පත් කිරීම් දැන් දැන් වැඩිවෙමින් පවතී.

මිනීමැරුම් වලින් සැහෙන ප්‍රමාණයක් ආසාමන්‍ය මානසික තත්ත්වයක් ඇති ඝාතකයින් මගින් සිදු වේ. තදබල ලෙස ශෝකයෙන් රෝගි වීම මින් ප්‍රධාන හේතුවකි. භින්නොන්මාදයෙන් පෙළෙන්නන් කලාතුරකින් මිනීමරුවන් බවට පත් වේ. මේවාට බොහෝවිට අසාමාන්‍ය සංවේදන (විශේෂයෙන් ශ්‍රවණ භ්‍රාන්තිමය තත්ත්ව) හේතු වේ. සමහර අපස්මාර තත්ත්ව වලින් පෙළෙන්නන් ද යම් යම් අවස්ථාවලදී මිනීමැරුම් සිදු කිරීමට පුළුවන. මෙවන් අවස්ථාවලදී ඔව්හු සාමාන්‍ය සිහිකල්පනාවලින් තොරවූ අවස්ථාවක සිටිති. බොහෝවිට අපස්මාර ස්වයංක්‍රියතා අවස්ථාවලදී (EPILEPTIC AUTOMATISM) කලාතුරකින් මෙවන් දේ සිදු විය හැක. මස්තිෂ්ක පිළිකා ඇතිවූ සමහර අවස්ථාවලදී (විශේෂයෙන් ශංඛක ඛණ්ඩිකාවේ) ප්‍රචණ්ඩකාරී තත්තත්ව වර්ධනය විය හැකි අතර මෙවැනි අවස්ථාවලදී ඝාතනය සිදුවිය හැකි ය. මිනීමැරුම් හා සම්බන්ධව සුලබ විෂදායක ද්‍රව්‍යය මත්පැන් ය. මීට අමතරව LSD ඇම්පිටැමින් හා වෙනත් විෂදායක සංයෝග ශරීරගත වීමෙන් හටගන්නා අස්වාභාවික මානසික තත්ත්වවලදී සිදුවන මිනීමැරුම් ද වාර්තා වී තිබේ.

❑